# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat, 1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
Fax 011 286 4051


මගේ අංකය / எனது இல / My No. L2/1/89/චක්‍රලේඛ/2022

ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date 2022.02.22

චක්‍රලේඛ 2022/03

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු,

<u>රජයේ ඉඩම් තුළ ඛණිජ ද්‍රව්‍ය කැණීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග</u>

භූ සම්පත් පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් නිකුත් කරන ලද ඛණිජ ද්‍රව්‍ය කැණීම, ප්‍රවාහනය හා වෙළඳාම පිළිබඳ කාර්ය සංග්‍රහයේ සඳහන් කරුණු පිළිබඳ තවදුරටත් පැහැදිලි කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ඒ අනුව, එම කාර්ය සංග්‍රහයේ සඳහන් උපදෙස් හා ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ඛණිජ ද්‍රව්‍ය කැණීම සම්බන්ධයෙන් වන ඉල්ලීම්වලට අදාල ඔබගේ නිර්දේශ ලබා දීමට ක්‍රියා කළ යුතු වේ. රජයේ ඉඩමකට අදාළව එවැනි ඉල්ලීමක් ලද පසු ඔබ විසින් ක්‍රියා කළ යුතු ආකාරය කාර්ය සංග්‍රහයේ තෙවන පරිච්ඡේදයේ සඳහන් කර ඇති අතර එම පරිච්ඡේදයේ සඳහන් කරුණු ඉතා සැළකිල්ලෙන් කියවා එම උපදෙස් පරිදි කඩිනමින් ක්‍රියා කර නිර්දේශ ලබා දීමට කටයුතු කළ යුතු වේ.

03. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේ යම් ඛණිජ වර්ගයක් කැණීම් කරනු ලබන ස්ථානයට පරිභාහිරව (ඛණිජය පවතින භූමි ප්‍රමාණය හැර) රජයේ ඉඩම් කොටසක් පරිහරණය කරන්නේ නම්, එසේ පරිහරණය කරනු ලබන රජයේ ඉඩම් කොටස සඳහා නියමිත පරිදි පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය මත ඉ.කො. 75 ආකෘතියෙන් වාර්ෂික අවසර පත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කළයුතු වේ.

04. එම ඉඩමේ නොදියුණු වෙළඳපොල වටිනාකම ප්‍රධාන තක්සේරුකරු වෙතින් ලබාගත යුතු අතර එම තක්සේරුවෙන් 4% ක ප්‍රතිශතයක් වාර්ෂික බදු මුදල ලෙස අය කළයුතු වේ. ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලැබෙනතෙක් දළ තක්සේරුව මත බදු අය කිරිමට ක්‍රියාකළ යුතු අතර තක්සේරු වාර්තාව ලද පසු නියමිත පරිදි සංශෝධනය කිරීම් කර බදු අය කළයුතු වේ. දළ තක්සේරුවට වඩා ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව වැඩිවන අවස්ථාවලදී වැඩිවන බදු මුදල සියළු හිඟ මුදල්ද සමඟ ගෙවීමට එකඟවන බවට ඉල්ලුම්කරු වෙතින් පූර්ව ලිඛිත එකඟතාවයක් ලබා ගැනීමට ක්‍රියා කළ යුතු වේ. ඉඩමට අදාළව දළ තක්සේරුව නිර්ණය කිරීම ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම්, ජනපද නිලධාරී හා සංවර්ධන නිලධාරී (ඉඩම) යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් සිදු කළ යුතු වේ.

05. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරනු ලබන දීමනාපත්‍ර, ප්‍රදානපත්‍ර, මධ්‍යම පන්තික දීමනාපත්‍ර (R ග්‍රාන්ට්ස්) මගින් බැහැර කර ඇති ඉඩම්වල ඛණිජ ඉවත්කර ගැනීම සම්බන්ධයෙන් පෞද්ගලික ඉඩම්වල ඛණිජ ඉවත්කර ගැනීමේ ක්‍රමවේදයම අනුගමනය කළ යුතුය. එම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේදී දීමනාපත්‍රයේ පවතින රක්ෂිත වගන්ති හා ගැටීමක් ඇති නොවන අතර, රක්ෂිත වගන්තිවලින් ඛණිජවල අයිතිය රජය සතුව පවත්වාගෙන ඇත. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මගින් කැලෑ නිෂ්පාදන ගාස්තු අය කිරීමෙන් එම අවශ්‍යතාවය සම්පූර්ණ වන බැවින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන ලද දීමනාපත්‍ර, ප්‍රදානපත්‍ර හා මධ්‍යම පන්තික දීමනාපත්‍ර (R ග්‍රාන්ට්ස්) ඉඩම්වල ඛණිජ ඉවත් කිරීම සම්බන්ධයෙන් ඔබගේ නිර්දේශ ලබා දීමක් අවශ්‍ය නොවන අතර භූ සම්පත් පිළිබඳ ජනාධිපති කාර්යසාධක බලකාය විසින් නිකුත් කරන ලද කාර්ය සංග්‍රහයේ මාර්ගෝපදේශ අනුව අදාල ආයතන ක්‍රියාකරනු ඇත.

06. මාගේ චක්‍රලේඛ අංක 2021/02 හි සඳහන් ගාස්තු ප්‍රමාණ පදනම් කර ගනිමින් කැණීම් කරනු ලබන ඛණිජ ප්‍රමාණයට අදාළ කැලෑ නිෂ්පාදන ගාස්තු අය කිරීම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මගින් සිදු කරනු ලබන අතර දීමනාපත්‍ර, ප්‍රදානපත්‍ර, මධ්‍යම පන්තික දීමනාපත්‍ර හා නියාදන සාධන පත්‍ර මගින් ස්ථිරවම බැහැර කර ඇති රජයේ ඉඩම්වල කැනීම් කරනු ලබන ඛණිජ ප්‍රමාණයට අදාල කැලෑ නිෂ්පාදන ගාස්තු අය කිරීම ද ඉහත චක්‍රලේඛයේ සඳහන් පරිදි භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මගින් සිදු කරනු ඇත. එසේ අයකරනු ලබන ගාස්තු සෑම මසකම 10 වන දිනට පෙර අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුමට ප්‍රේෂණය කිරීමට පරිසර අමාත්‍යාංශය විසින් ක්‍රියා කරනු ඇත.

07. කාර්ය සංග්‍රහයේ සඳහන් උපදෙස් හා ක්‍රියාමාර්ග නිසි පරිදි අනුගමනය කරමින් සේවාලාභීන් වෙත කාර්යක්ෂම සේවාවක් ලබාදීමට ක්‍රියාකළ යුතු බව විශේෂයෙන් සඳහන් කර සිටින අතර කාර්ය සංග්‍රහයේ සඳහන් කරුණු පිළිබඳ යම් ගැටළුවක් හෝ අපැහැදිලි තාවයක් පවතින්නේ නම් ඒ සම්බන්ධයෙන් ම වෙතින් උපදෙස් ලබා ගැනීමට ක්‍රියාකරන ලෙස කාරුණිකව දන්වමි.

ජී.ඩී. කීර්ති ගමගේ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :
01. සභාපති, භූ සම්පත් පිළිබඳ ජනාධිපති කාර්යසාධක බලකාය
02. ලේකම්, ඉඩම් අමාතංශය
- කරු.දැ.ගැ.ස.

03. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය
04. සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරු/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරු
05. සියලුම අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්වරු
- කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.